# Trekmentor

Buddhism | State Governance | World Peace

https://www.trekmentor.com/ https://www.lankagov.org/ info@trekmentor.com

---

කමල් වික්‍රමනායක
41/1, රඹුක්කන පාර,
මාවතගම.

දිනය: 2026-01-26

ගරු අධිකරණ සේවා කොමිෂන් සභාව,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573, හෆ්ස්ට්ඩ්‍රොප්,
කොළඹ 12.

ගරු සාමාජික තුමනි,

**<u>අධිකරණ තුළ රාජ්‍ය ලාංඡනය අගෞරවනීය ලෙස ස්ථාපනය කොට තිබීම</u>**

යම් යම් අධිකරණ තුළ රාජ්‍ය ලාංඡනය ගරු විනිසුරුතුමන්ලාට ඉහළින් සහ ඍජුවම පිටුපසින් ප්‍රදර්ශණය කෙරෙමින් පවතින බව නිරීක්ෂණය කළෙමි. ඉහළින් ස්ථාපනය කර තිබීම ඉතාම සුදුසුය. එහෙත් ඍජුවම පිටුපසින් ස්ථාපනය කර තිබීමේ යම් අගෞරවනීයත්වයක් ඇත.

රාජ්‍ය ලාංඡනය ඍජුවම පිටුපසින් ස්ථාපනය කර තිබෙන විට ගරු විනිසුරු තුමන්ලාට ඊට පිටුපස හරවාගෙන සිටින්නට සිදුවේ. මෙය ගරු විනිසුරුතුමන්ලා අතින් ශ්‍රී ලංකා ජනරජයට කෙරෙන අගෞරවයක් සේ දකිමි. ජනරජ ලාංඡනයේ ඉහළින්ම ධර්ම චක්‍රය වේ. ඊට ද ගරු විනිසුරු තුමන්ලා පිටුපස හරවාගෙන සිටීම මා තුළ සංවේගයක් ඇති කරයි.

මීට පිළියම් ලෙස රාජ්‍ය ලාංඡනයට වමින්, දකුණින් හෝ දෙපසින් විනිසුරු අසුන් ස්ථාපනය කිරීම හෝ විනිසුරු අසුන්වලට පිටුපස ඇති රාජ්‍ය ලාංඡන ඍජුවම ආසනවලට පිටුපස නොතිබෙන පරිදි මදක් පැත්තකින් ස්ථාපනය කිරීම හෝ විනිසුරු අසුන්වලට මදක් ඉදිරියෙන් වහලෙන් පහලට එල්ලෙන පරිදි රාජ්‍ය ලාංඡනය ස්ථාපනය කිරීම යෝජනා කරමි. අංශක 90 ක තරම් ඇලයකින් පිහිටා ඇති පැති බිත්තියක ස්ථාපනය කිරීම අධිකරණයේ රැස්වන පිරිසට එය කෙලින්ම නොපෙනීමට හේතුවක් විය හැකි බැවින් එය ද නුසුදුසු යැයි සිතමි.

ස්තුතියි.

කමල් වික්‍රමනායක